## සන්නිවේදනය හා මධ්‍ය අධ්‍යයනය - 13 ශ්‍රේණිය

## 08 පාඩම - මහජන සම්බන්ධතා හා සිද්ධි කළමනාකරණය

1. මහජන සම්බන්ධතා යන්න නිර්වචන ඇසුරෙන් පැහැදිලි කරන්න.
2. මහජන සම්බන්ධතා සංකල්පයක් ලෙස වර්ධනය වූයේ කුමන හේතුවක් මුල් කරගෙනද?
3. ප්‍රථම මහජන සම්බන්ධතා කාර්යාලය ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින් ද?
   ඊට බලපෑ හේතුව කුමක්ද?
4. මහජන සම්බන්ධතා ඓතිහාසිකව වර්ධනය වූ ආකාරය පිළිබඳව ජේම්ස් ගෲනිග් සහ ටොඩ් හන්ට් විසින් හඳුන්වා දුන් පහත සඳහන් ආකෘති හතරට අයත් කාල සීමාවන්හි දී සිදුවූ විශේෂ සිදුවීම් තුන බැගින් ලියන්න.

   i. 19 වන සියවස - පුවත් නියෝජිත ආකෘතිය

   ii. 20 වන සියවස මුල් භාගය - මහජන තොරතුරු ආකෘතිය

   iii. 1900 දශකය - ද්විමාර්ගික අසමමිතික ආකෘතිය

   iv. 1980 - ද්විමාර්ගික සමමිතික ආකෘතිය

5. ස්වදේශීය වශයෙන් අතීතයේ දී මෙරට පැවැති මහජන සබඳතා අවස්ථා පහක් නම් කරන්න.
6. ආයතනයක් ලෙස පාසලට මහජන සම්බන්ධතා වැදගත් වන්නේ ඇයි? කරුණු හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
7. පාසල බාහිර සමාජය සමග මහජන සම්බන්ධතා පවත්වන අවස්ථා හතරක් නම් කරන්න.
8. මහජන සම්බන්ධතා දැන්වීම්කරණයෙන් වෙනස් වන්නේ කෙසේද? කෙටියෙන් පැහැදිලි කරන්න.
9. විවිධ මහජන සම්බන්ධතා අවස්ථා නම් කරන්න. ඒ අතුරින් රාජ්‍ය මහජන සම්බන්ධතා යනු කුමක්දැයි දක්වා මේ මොහොතේ දී කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ රාජ්‍ය මහජන සම්බන්ධතා ක්‍රියාවලිය සිදුවෙමින් පවතින ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න.
10. ආපදා කළමනාකරණ අවස්ථාවක් ලෙස කොවිඩ් 19 වෛරස තත්ත්වය පාලනය සහ මහජනතාව දැනුවත් කිරීම සඳහා මේ මොහොතේ දී රජය සහ මාධ්‍ය ආයතන විසින් උපයෝගී කරගනු ලබන විවිධ මහජන සම්බන්ධතා මෙවලම් හා විධික්‍රම මොනවාද?

Hewavitharana M.V.

ඉන් දෙකක් ප්‍රායෝගිකව ක්‍රියාවට නැගෙමින් පවතින ආකාරය විස්තර කරන්න.

11. ආයතනයක් තුළ සේවකයන් හා කළමනාකරුවන් අතර අභ්‍යයන්තර මහජන සම්බන්ධතා ගොඩනගා ගැනීමට භාවිත කළ හැකි අභ්‍යන්තර මහජන සම්බන්ධතා මෙවලම් හා විධික්‍රම හතරක් නම් කරන්න.

12. එළැඹෙන මහ මැතිවරණයේ දී ප්‍රජා සම්බන්ධතා ගොඩනගා ගැනීමට දේශපාලනඥයන්ට භාවිත කළ හැකි මහජන සම්බන්ධතා මෙවලම් හා විධික්‍රම මොනවාද?

13. මහජන සම්බන්ධතා නිලධාරියෙකු විසින් ඉටු කළ යුතු මූලිකම කාර්යය වන්නේ කුමක්ද?

14. මහජන සම්බන්ධතා නිලධාරියෙකුට පැවරෙන වගකීම් මොනවාද?

15. හදිසි ආපදා තත්ත්වයක් ලෙස හැඳින්විය හැකි කොවිඩ් 19 වසංගතය හමුවේ රජය සහ මහජනතාව අතර සබඳතා ගොඩනගමින් රාජ්‍ය අංශය වෙනුවෙන් මහජන සම්බන්ධතා නිලධාරීන් ලෙස කටයුතු කරමින් සිටින වෘත්තිකයන් හතර දෙනෙකු නම් කරන්න. (නිල නාමයන් සඳහන් කරන්න.)

16. මහජන සම්බන්ධතා නිලධාරියෙකු සතු විය යුතු කුසලතා හා ගුණාංග වෙන වෙනම දක්වන්න. මේ මොහොතේ දී මහජන සම්බන්ධතා නිලධාරියෙකු ලෙස නියෝජ්‍ය පොලිස්පතිතුමා විසින් ඉටු කරමින් පවතින කාර්යය භාරය තුළ ඔබ ඔහු තුළින් ඉහත සඳහන් කළ කුසලතා හා ගුණාංග දකින ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

17. මාධ්‍ය නිලධාරියා යනු කවරෙක් ද? මාධ්‍ය නිලධාරියා වෙත පැවරෙන කාර්යයන් හයක් නම් කරන්න.

18. මෙම ආපදා අවස්ථාව් දී නිල වශයෙන් මාධ්‍ය වෙත ප්‍රකාශ නිකුත් කිරීමේ බලය හිමිවී ඇති පහත සඳහන් මාධ්‍ය නිලධාරීන් අතරින් එක් අයෙකු තෝරාගෙන ඔහු /ඇය වෙතින් ඉහත ඔබ සඳහන් කළ කාර්යයන් ඉටු වෙමින් පවතින්නේ දැයි විමර්ශනය කරන්න.

    i යුධ හමුදාපති — ii නියෝජ්‍ය පොලිස්පති

    iii ජාතික රෝහල් අධ්‍යක්ෂ — iv සෞඛ්‍ය ඇමතිතුමිය

19. සිද්ධි කළමනාකරණය යනු කුමක් ද? එහි ප්‍රධාන අරමුණ නම් කරන්න.

20. සිද්ධි කළමනාකරණයේ අවශ්‍යතාව හා එහි වැදගත්කම කුමක්ද? කරුණු හතරක් නම් කරන්න.

21. පිලිප් කොට්ලර් විසින් හඳුන්වා දුන් සිද්ධි වර්ගීකරණය දක්වා ඒ එක් එක් අවස්ථාවට උදාහරණ තුන බැගින් ලියන්න.

21. සිද්ධි කළමනාකරණයේ මූලික පියවර හතර නම් කරන්න.



Hewavitharana M.V.

22. ඔබ රාජගිරිය ප්‍රදේශය භාර ප්‍රාදේශීය ලේකම්වරයා යැයි සිතන්න. කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වයෙන් ඔබ ප්‍රදේශය මුදවා ගැනීම සඳහා සිද්ධි කළමනාකරු වශයෙන් ඔබ මෙම සිද්ධිය කළමනාකරණය කරන ආකාරය පැහැදිලි කරන්න.

***කිසිවක් හෝ කිසිවෙක් නිසා අධ්‍යාපනය ගිලිහී යාමට ඉඩ නොදෙන්න.***

***අවසානයේ ඔබ තනිවූ දිනෙක...........***

***ඔබ එක් කරගත් උගත්කම කෙතරම් ඔබට පිහිටවනවා දැයි ප්‍රත්‍යක්ෂ වනු ඇත.***

2020.03.26

Hewavitharana M.V.